


# හක්කේ බුදු රැස් වුණාට බොක්කේ දඩ මස්

ගෙට ගොඩ වූ මා පසුපස ආ කොයින් මාමා " කෙලී වලට ගියා.. ඉරමුසු දිය ටිකක් රත් කරන්ටද..?" ඇසුවේ වෙහෙස වී ගෙට ගොඩ වන තම දරුවාගෙන් අසන පියෙකු මෙනි.

"හීලෙට මුං කිරිබත් ගිල දැම්මා.. කුසේ ඉඩ නැතුවා.. මං වැඩ කරනවුන් ටික බලලා එඤ්ඤදං.."

"විගැහින් එමු.. ගල්කන්දෙ රාළ වළි කුං ආනමත් එක්ක ගෝනල හරි කොරාන එනවා කිව්වා.. උගෙ කුඹුර ගිඩි ගිඩියෙන් තනා දුන්නට හිත හිතා උන්නෙ උඹට කොහොම සලකන්ටෑ කියල .."

"අහවල් සැළකිල්ලක්ද මාමා..? හේන් ඉම එකාලට උදව් කරන්නෙ ඕව බලාගෙන නෙවෙයි.."
"මේ ඉම හැම එකාම දන්නවා ඒක.. බොට ලෙංගතු ඒක නෙවැ.. මාත් ගිඩි ගිඩියෙ එල්ලෙන්ටද බොට කාරණාවක් කියන්ට.."

"මොකෑ මාමා..? යමිං ගමන කියපං.."
ගස් කපන මැන්ඩියේ ට්‍රැක්ටරය නවතා සෙවණ ඇති ගසක් යට වාඩි වූ මා අසළ උන්දෑ වාඩි වූයේ බර සුසුමක් පිට කරමින්..

"මොකෑ මාමා ආරෝවක් ද..?"

"නැතුවා.. බොට කරදර කරනවා නොවෙයි.. මගේ අපුච්චා වල පල්ලට දෙරි ගැහිලා සූරිය වට ගමං පහළොහක් වෙනවා හය දොහොකට එපිට.. එදාට හාන්දුරු නමක් පැලට කැන්දලා දං අඩුක්කුවක් එක්ක සිවුරු පාත්තරයක් පූජා කරන්ට ඉස්පාසු තියේ නං පහුදොහ මා වලපල්ලට දෙරි ගැහුණත් කමක් නැහැ.."

"ඕක මහ කජ්ජක්ද මාමා.. අදම යමං මාත් එක්ක සෙයිලමට දං අඩුක්කුවට අඩුම කුඩුම ගේන්ට.. "

"මා අත උඹ දුන්න කාසි පනම් ඇති.."
"ඒව තියාගනීං මාමා.. ඉඳිං මේකලාට ඉර ගිලෙන්ට කලින් කොරන්ට ඕනෙ හරිය පංගරාර්තු කරලා එනකං.."

කලයුතු දෑ වාඩියේ අයට පවසා මාමා සමග සෙයිලමට යන්න පිටත්වුණෙමි.

"ඒකලා උඹට හීලෑ කරගත්ත මී නාම්බො ගාණයි.." කායින් මාමා කියන්නේ වැඩ මණ්ඩියේ ගෝලයන් ගැන ය..
"ඒ ගානට තමයි මං ඒකලා තියං ඉන්නෙ.. ඉස්සෙල්ලාම යමං මාමා දකුණු ඇලේ මහ විහාරෙට.. "
"ඒ උන්නාස්සෙලා උඹ අඳුනනවා නොවැ.."

"ඔව් මාමා .. බෝධිය තනන්ට ගල් වැලි සේරම මා නොවැ ළං කළේ.. ලොකු හාමුදුරුවො මගෙත් එක්ක බොහොම කිට්ටුයි.. හතර නමක් ඉන්නවා.. මං ඒ හතර නමම උඹේ පැලට වඩම්මනවා මාමා.."

"මනාප වෙයිද අපේ පැල් කොටේට වඩින්ට..?"
"ඒවා කතා කරන්නෙ මං නොවැ.. උඹ ඉඳිං පැත්තක.. බුදු හාමුදුරුවො අපි හැමෝටම කිව්වෙ එක බණයි.. එහෙව් එකේ පැලට මාලිගාවට කියලා නොවැඩ කොහොමද.. ඕං කතාවෙන් ළඟටම ආවා.. ආන් ලොකු හාමුදරුවෝ බෝ මලුවේ.. යමු මාමා අපි එතෙන්ට.."

අපි පන්සලට ගොඩවත්ම ලොකු හාමුදුරුවෝ අප ඉදිරියට ආවේ ලෙංගතු සිනාවකින් යුතුව ය..

"ආ මහත්තයා ආව එක හොඳයි.. "
"අවසරයි අපේ හාමුදුරුවනේ.."

"ඕක තමයි මහත්තයෝ පිං කරන්නට පින තියෙන කෙනාට ඒක ළඟටම එනවා කියන්නෙ.."
"එහෙම කිව්වෙ අපේ හාමුදුරුවනේ..?"

"මේ බණ ගේ වහල දිරලා.. ලී කෑලි ටිකක් ඉල්ලාගන්ට ඒක මානා වහන්ට කලියෙන් තනා ගන්ට එපායැ.. දැන් හත්දා වැහිත් කිට්ටුයි නොවැ.. ඒකටයි මහත්තයා මුණගැහෙන්ට උන්නෙ.."

"ඒක මං කරලා දෙන්නං හාමුදුරුවනේ.. ඔබ වහන්සේ කරදර වෙන්ට එපා.. මාළඟ වැඩ කරන දෙන්නෙක් ඉන්නවා වඩු වැඩ දන්න.. ලීත් අරගෙන උන් දෙන්නා එක්ක එන්නං.. උදව්වට කීපදෙනෙක් හිටියම ඇති.."

"මහත්තයා තකහනියක්ම මේ රාළ ත් එක්ක..?"
"මාමා.. ඔය දැහැත් වට්ටිය හාමුදුරුවන්ට පිළිගැන්නුවා නම්.."
"හොඳා.."

"මොකෑ රාළෙ මේ මහත්තයා එක්ක.."
"මගේ අපුච්චා වල පල්ලට දෙරි ගැහිලා සූරිය වට පහළොවක් වෙනවා හය දොහොකට එපිට.. දං කදක් පූජා කරගන්ට අවසරයි හාමුදුරුවනේ.. ඔබ වහන්සේට බුදු බව අත්වෙයි.. පපු කැනැත්තෙ උණ්ඩි කොරාන ඉන්ට බැරි තැන මහතැන්ගෙ කනේ තිබ්බෙ.."

"හොඳා හොඳා.. පුලුපුලවන් විදියට ලක ලෑස්ති වෙමුකො.. දැන් කවදා දිහාටද..?"

"සෙනසුරාදා රාත්තිරියෙ බණ.. පහුනුදා දන.. එහෙම හොඳයි නේද හාමුදුරුවනේ..? හතරනමකට වැඩි වුණී අපි මනාපයි.. අපි ගිහිල්ලා එන්නං හාමුදුරුවනේ.. අපි හෙටම වැඩ පටන් ගන්නං.."

"මහත්තයාට සිරිමා බෝදියෙ පිහිටයි ආරස්සාවයි.. රාළේ මහතැන් හොඳට බලාගනින්.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.. මගේ දෑහ වගේ රැකුම් ලන්නෙ.."
"ගිහින් එමු.."

පන්සල පසු කර ට්‍රැක්ටරය ළඟට එන විට ඉදිරියට එන මිනිහා දැන ඉදිරියට එන මිනිහා දැක කොයින් මාමා උපහාසයට හක් හක් ගා හිනා කොරයි.

"මොකෑ කොයින් මාමා හිනෑ කොරේ..?"

"හිනා නොකර පුලුවනෑ.. කැලේ ඉන්න සතා සීපාවා දෙරි ගහන ගමං බුදුන් වඳින්ටත් එනවා.. අබුද්දස්ස කාලේ..ඕකට තමා කියන්නෙ

*ඉත්තේ කොස් එක වුණා ට අත්තේ ගෙඩි පුස් තත්තේ දිස්ටිය තිබුණාට නැත්තේ අනුහස් රැක්කේ පෙහෙවස් වුණා ට දැක්කේ වස් දොස් හක්කේ බුදු රැස් වුණාට බොක්කේ දඩ මස්"*

"උඹටත් මාමා ඕනෑ එකකට කියන්ට යමක් තියෙනවා.... යමං යමං.. කරන්ට කොච්චර කාරි තියෙනවද.. විගැහිං යමං'"

බෝගල

**"බෝගල ගේ කතා"** දැන් තිසර ගුවන් විදුලියේ
www.sannasa.net ඔස්සේ හෝ ඔබේ දුරකතනයෙන් තිසර හා එක්වන්න

# 'බැලීම'- පද බැඳුම් එකතුවක්

මෙල්බර්න් නුවර වාසය කරන ආචාර්ය ස. ම. රන්ජිත් ආනන්ද ගේ අළුත්ම කාව්‍ය සංග්‍රහය 'බැලීම' නමින් මුද්‍රණයෙන් පිට වී තිබේ. මෙයඔහුගේසිව්වනකාව්‍ය සංග්‍රහය යයි සිතමි.

තම කවිඑකතුව කතුවරයා විසින් නම් කරනු ලැබ ඇත්තේ පද බැඳුම් එකතුවක් ලෙස ය. තම නිර්මාණ කවිදැයි හෝ වෙනත් යමක්දැයි නොදන්නා බව ද කතුවරයා පවසයි.

මෙම කාව්‍ය සංග්‍රහය කියවීමේදී මා තුළ ඇතිවූ අදහස් කෙටියෙන් පහත දක්වමි. මේ අදහස් විචාරයකට වඩා මේ පද බැඳුම් කියවීමෙන් රසිකයකු ලද ආස්වාදය පිළිබිඹුකරන්නක් ලෙස සැලකිය යුතුය.

ස. ම. රංජිත් ආනන්දයන් තම කවි කල්පනාවලට වස්තු කොටගත් අත්දැකීම් හා යොදාගත් ආකෘතිද විවිධාකාර ය. මේ විවිධත්වය නිසා කාව්‍ය ග්‍රන්ථයට අමුතු ආලෝකයක් ලැබෙයි.

සුන්දර කාව්‍යමය සිතිවිලි මෙන්ම දාර්ශණික සිතිවිලිද මේ පද බැඳුම් අතරින් මතු වෙයි. ජපන් හයිකු කවි සිහි ගන්වන කෙටිකාව්‍යමය ආකෘතිය බොහෝ කවි සංකල්පනා සඳහා උපයෝගී කරගෙන ඇත.

බොහෝ කවීන් මෙන්ම ස. ම. ආනන්දගේ කවි වලට ද ප්‍රේමය වස්තු වී ඇත. 'මඟහරින්නට බැරිවුනුවිට' යන කවිය මිනිස් සිතේ ඇතිවන සංකීර්ණ සිතිවිල්ලක් පද්‍යයට නැඟීමට දැරූ හොඳ ප්‍රයත්නයකි. 'පියානෝව'යන සිඟිති කවිය ද එවැන්නකි.

ඔබේ
සියුමැලි දිගු
ඇඟිලි තුඩු මත
පියානෝවක්ද
මගේ
හදවත




'පින්ඇතිනම්', 'බැලීම', 'පෙනීම', 'සිතීම' යන කවිපන්ති දාර්ශණික සිතිවිලි නිරූපණය කරන කවි සංකල්පනා වලට නිදසුන් කොට දැක්විය හැකි ය.

නවකතාව, කෙටිකතාව හෝ කවිය වැනි කවර සාහිත්‍යාංගය දී වුව ද නිර්මාණය තුළින් කතුවරයා මතු පිටට නොපැමිණිය යුතු ය. කතුවරයා මතු පිටට ඒම සහෘදයාගේ නිර්මාණ ආස්වාදයට බාධාවකි. 'බැලීම' රසවිඳීමේදී දෙතුන් තැනක දී මේ අදහස් මගේ සිතට නැංගේ ය. 'දාදු කැටය' යන පද්‍යය ඉන් එකකි.

කවිය යනු භාෂාවක් ඇතුලත ඇති තවත් භාෂාවකි. කවියෙන් කියනුයේ අදහස් නොව හැඟීම් ය. නැතිනම් රස බවට පත්කරන ලද හැඟීම් ය. වචනයෙන් පවසන දේට අමතරව යම් අරුතක් ධ්වනිත වන ලෙස පද පෙළ ගස්සන්නට හොඳ කවියකු සමත් වෙයි.

'ඔරලෝසුව' යන කවියට තියුණු දාර්ශනික හැඟීමක් පිළිබිඹු කරන සංකල්පනාවක් පාදක වී ඇත. එහෙත් කවියා යොදාගත් බස් වහර නිසා එය ඍජු ප්‍රකාශයක් වෙයි. අදහස් ගොන්නක් ඍජුව පළකිරීම වෙනුවට එම අදහස් ධ්වනිත වන හැඟීම් සමුදායකට පෙරළන කවි බස්වහරක් යොදා ගත්තේ නම් 'ඔරලෝසුව' යන කවිය වඩාත් හොඳ නිර්මාණයක් වන්නට ඉඩ තිබිණ.

'වළාකුළ සහ මම', 'මකුළු දැල', 'කඹඇදිල්ල' යන කවි ද එක පෙළට ලිව්වොත් පද්‍යයක් නොව ගද්‍ය කිහිපයක ස්වරූපය ගනී. 'ඇතිනැති' යන පද පෙලද තනිකරම ගද්‍යයකි. කෙලින්ම අදහස් පළකිරීමකි.




'බැලීම' පද බැඳුම් එකතුව තුළ කතුවරයා කිසියම් අත්හදා බැලීම් කිහිපයක්ද යෙදී ඇතැයි මම අනුමාන කරමි. පද සංඝටනාවට අමතරව එයින් ධ්වනිත වන හැඟීම පළ කිරීමට චිත්‍රයද උපයෝගීකර ගත් සැටියක් පෙනේ. 'මන්ද', 'පොකුණ සහ දියබිඳුව' යන පැදි මෙයට නිදසුන් ය.

පොත පුරාම තැනින් තැන යොදා ඇති සිඟිති සිතුවම් ද, පදවැල් වල අර්ථය තීව්‍ර කරමින් අමුතු චමත්කාරයක් දනවයි.

වලාපෙලින් එළියටපැමිණ
මුදාසොම්සඳ විදුලිසැර

යන කවියේ මාතෘකාවද සිහින් සිතුවමකි.

'අයියා' හා 'තාත්තා' යන පැදි පෙළවලට යොදා ඇති ආකෘතිය මගේ සිත් ගනී. ඒ පැදි දෙකෙන්ම ධ්වනිත වන හැඟීම් තීව්‍ර වන ලෙස පද පෙළ ගස්වන්නට කවියා සමත් වෙයි. 'තාත්තා' නමැති කවිය මෙසේය.

සිටියි සැරයටිය
වාරු නැතිව වගේ

සිටින උපැස් යුවළ
කම්මැලි කමින් වගේ

සිටින්නීය අම්මා
හරි සිහිනැතිව වගේ

සිටියි ලොකු මල්ලී
බාගෙට මිය ගියා වගේ

සිටියි තාත්තාගේ පිළිරුවනම්
හරියටම පණ පිටින් වගේ

උසස් කවි සිතිවිලි ද හොඳ කුසලතාවක් හා කවි ශක්තියද පෙන්වන නිර්මාණ ස. ම. රන්ජිත් ආනන්ද ගේ 'බැලීම' පද්‍ය සංග්‍රහය තුළ දක්නට ලැබේ. මේ සටහන ලිව්වේ එම පද බැඳුම් කියවීමෙන් මා ලැබූ ආස්වාදය නිසාය.